සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade 10	බුද්ධ ධර්මය I	කාලය நேரம் Time පැය 01යි.

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

■ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. ශාන්ත වූ ප්‍රියංකර වූ බෝසතුන්ගේ අනූපමේය රූපශ්‍රීය දැක "මෙවන් පුතෙකු ලද මවක් පියෙක් නිවුණෝ වෙති." යනාදී වශයෙන් ප්‍රකාශ කරනු ලැබුවේ,
(1) යසෝදරා දේවිය (2) විශාකා සිටු දුව (3) කිසාගෝතමිය (4) ප්‍රජාපතී ගෝතමිය

2. සිදුහත් බෝසතාණන් වහන්සේට මුහුණ දීමට සිදු වූ අභියෝගයක් නොවන්නේ මින් කුමක් ද?
(1) සතර පෙර නිමිති දැකීම (2) පස්කම් සුවය අත් හැරීම
(3) නිබ්බූත පද ඇසීම (4) මාර දූවරුන්ට මුහුණ දීම

3. ධර්ම රත්නය සහ සංඝ රත්නය ලොව පහළ වූ පොහෝ දින පිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ
(1) වෙසක් පොහෝ දින හා දුරුතු පොහෝ දින (2) ඇසළ පොහෝ දින හා වෙසක් පොහෝ දින
(3) වෙසක් පොහෝ දින හා උඳුවප් පොහෝ දින (4) වෙසක් පොහෝ දින හා ඇසළ පොහෝ දින

4. පංච නීවරණ ධර්මවල බොර ජලයට උපමා කර ඇත්තේ
(1) විචිකිච්ඡාව (2) කාමච්ඡන්ද (3) ව්‍යාපාදය (4) ථීනමිද්ධ

5. බුදු රජාණන් වහන්සේ ආර්ය මාර්ගය අනුගමනය කළ හෙයින් ද නිර්වාණයට සැපැත් වූ හෙයින් ද, යහපත් වචන පවසන හෙයින් ද,
(1) අරහං නම් වන සේක (2) සුගත නම් වන සේක
(3) බුද්ධ නම් වන සේක (4) භගවා නම් වන සේක

6. පිරිසිදුව කටයුතු කිරීම, කයින් වචනයෙන් හා සිතින් නිදොස් දේ කිරීම, පව්කම් අකුසල් නොකොට පින්කම් කුසල් කිරීම යන අදහස් ඇතුළත් පාඨය කුමක් ද?
(1) සතිමතෝ (2) සුචිකම්ම (3) අප්පමත්ත (4) සඤ්ඤත

7. සීලයේ ආනිසංස ලෙස දැක්විය නොහැක්කේ මින් කුමක් ද?
(1) කීර්තිය පැතිරීම. (2) මහත් වූ භෝග සම්පත් අත්කර ගැනීම.
(3) සිහි මුලා වී කලුරිය කිරීම. (4) මරණින් මතු සුගතියේ ඉපදීම.

8. මරණාසන්න මොහොතේ දී සුගතියම දැක සිහියෙන් යුතු ව කලුරිය කළ උපාසකතුමා වන්නේ,
(1) අනේපිඬු උපාසකතුමා (2) ධම්මික උපාසකතුමා
(3) අතුල උපාසකතුමා (4) චිත්ත ගෘහපතිතුමා

9. සිඟාලෝවාද සූත්‍රයේ දක්වා ඇති පරිදි දෙමාපියන්ගෙන් දරුවන්ට හිමි විය යුතු යුතුකමක් නොවන්නේ
(1) ගේ දොර වගකීම් පවරා දීම. (2) දරුවන් වරදින් මුදවා ගැනීම.
(3) සුදුසු කල්හි සම්පත් පවරා දීම. (4) ඉගෙනීම් කටයුතුවල යෙදවීම.

Past Papers Wiki

10. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් පරිදි ආමිසයෙන් සංග්‍රහ කිරීමත්, මෛත්‍රී සහගතව කතා කිරීමත් යන යුතුකම් ඉටුකළ යුතු වන්නේ
(1) භික්ෂූන් වහන්සේලා විසින් ගිහියන්ට
(2) ගුරුවරුන් විසින් ශිෂ්‍යයින්ට
(3) සේව්‍යයන් විසින් සේවකයන්ට
(4) ගිහියන් විසින් භික්ෂූන් වහන්සේලාට

11. බෝසතාණන් වහන්සේ අභිනිෂ්ක්‍රමණයෙන් අනතුරුව අරියපරියේසනයෙහි යෙදුණු කාලය වන්නේ,
(1) වසර 29 කි.
(2) වසර 8 කි.
(3) වසර 6 කි.
(4) වසර 35 කි

12. ජාතික ආගමික සහජීවනය ගොඩනංවන බෞද්ධ ඉගැන්වීමක් නොවන්නේ මින් කුමක් ද?
(1) පංචශීලය
(2) දස රාජ ධර්ම
(3) සිව් බඹ විහරණ
(4) සතර සංග්‍රහ වස්තු

13. තිදොරින් සිදුවන අකුසල කර්මවල මනෝ කර්ම ගණයට ඇතුළත් වන්නේ
(1) පරුසාවාචා
(2) ප්‍රාණඝාත
(3) පිසුනා වාචා
(4) මිත්‍යා දෘෂ්ටිය

14. කිසියම් පුද්ගලයෙකු උපත ලබන්නේ යස ඉසුරින් පිරුණ ස්ථානයක නම් පෙර භවයන්හි දී සිදු කරන ලද අකුසල කර්මවල විපාක බොහෝ විට වැළකී යැයි ධර්මයෙහි මෙය හැඳින්වෙන්නේ,
(1) ගති සම්පත්ති නමිනි.
(2) කාල සම්පත්තිය නමිනි.
(3) ප්‍රයෝග සම්පත්තිය නමිනි.
(4) උපධි සම්පත්තිය නමිනි.

15. ප්‍රතිසන්ධියක් ලබා දීමට ඉවහල්වන කර්මය වන්නේ
(1) ජනක කර්මය
(2) ගරුක කර්මය
(3) ආසන්න කර්මය
(4) උපත්ථම්භක කර්මය

16. බුදු දහමට අනුව හට ගැනීමේ ස්වභාවයෙන් යුතු සෑම දෙයක් ම නැති වීමේ ස්වභාවයෙන් ද යුක්ත ය. මෙය බුදු දහමේ දක්වා ඇත්තේ
(1) නියාම ධර්ම ලෙස
(2) ලෝක ධර්ම ලෙස
(3) කර්මය ලෙස
(4) අනිත්‍ය ධර්ම ලෙස

17. සසර දුකින් නිදහස්ව නිවන් දක්නා ජාති දක්වා කිසියම් භවයක දී විපාක ලබා දීමට සමත් කර්ම හඳුන්වන්නේ
(1) දිට්ඨධම්මවේදනීය කර්ම ලෙස
(2) උප්පජ්ජවේදනීය කර්ම ලෙස
(3) උපපීඩක කර්ම ලෙස
(4) අපරාපරියවේදනීය කර්ම ලෙස

18. සැරියුත් මහරහතන් වහන්සේ බුදු සසුනෙහි පැවිදි වීමට පෙර පැවිදිව සිටියේ කවුරුන් සමීපයේ ද?
(1) නිගණ්ඨනාථ පුත්ත සමීපයේ ය.
(2) පකුධ කච්චායන සමීපයේ ය.
(3) සංජය පිරිවැජියා සමීපයේ ය.
(4) ආලාර කාලාම සමීපයේ ය.

19. මහ ඇතාගේ අඩි සලකුණු තුළට වනයෙහි ඕනෑම සතෙකුගේ අඩි සලකුණු ඇතුළු කළ හැකිය. එමෙන් ම පන්සාළිස් වසක් මුළුල්ලේ බුදු රජාණන් වහන්සේ වදාළ ධර්මය ඇතුළත් කළ හැකි ප්‍රධානම ධර්ම කරුණ නම්,
(1) චතුරාර්ය සත්‍යය
(2) සතර සංග්‍රහ වස්තු
(3) කර්මය
(4) සතර මහෝපදේශ

20. පංචස්ඛන්ධය නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ
(1) රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ
(2) රූප, සංස්කාර, තණ්හා, භව, ජාති
(3) චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය
(4) රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ

21. අනුන්ගේ යහපත හා දියුණුව පිණිස කටයුතු කිරීම
(1) දානයයි (2) අර්ථචර්යාවයි (3) කරුණාවයි (4) සීලයයි

22. බහුජාතික සහ බහු ආගමික සමාජයක් තුළ අන්‍ය ආගම්වලට ද ගරු කරමින් තම අනන්‍යතාව තහවුරු වන ලෙස ජීවත් වීම නම්
(1) කරුණාව යි. (2) මුදිතාව යි. (3) සහජීවනය යි. (4) ශ්‍රද්ධාව යි.

23. බුදු රජාණන් වහන්සේ අම්බට්ඨ සූත්‍රය දේශනා කරන ලද්දේ
(1) අචිරවතී නදී තීරයෙහි පිහිටි අඹ වනයෙහි දී
(2) ඉච්ඡානංගල වනයෙහි වැඩ සිටිය දී
(3) ඇටවිරියා වනයක දී
(4) ජීවක අඹ උයනේ දී

24. උදේන, ගෝතමක, සත්තම්බක, සාරන්දද ආදී වශයෙන් චෛත්‍ය ස්ථාන ගණනාවක් රමණීය බව පෙළ දහමේ දක්වා තිබේ. එම චෛත්‍ය ස්ථාන දැකිය හැකි වන්නේ
(1) බරණැස් නුවර යි. (2) රජගහ නුවර යි.
(3) විශාලා මහ නුවර යි. (4) කුසිනාරා නුවර යි.

25. "සත්හට වන බව දුකට වෙදාණන්" යන ලෝවැඩ සඟරාවේ එන කවි පදයට අනුව බුදුරජාණන් වහන්සේ
(1) ගුරුවරයෙකු වන සේක. (2) ආගමික නායකයෙකු වන සේක.
(3) මාර්ගෝපදේශකයෙකු වන සේක. (4) වෛද්‍යවරයෙකු වන සේක.

26. ගිරිමානන්ද හිමියන්ට දේශනා කරන ලද රෝග වැළඳීමට හේතු වන කරුණු අටට ඇතුළත් නොවන්නේ
(1) සෙම් ධාතුව කිපීම (2) වාතය කිපීම
(3) පිත් ධාතුව කිපීම (4) ලේ ධාතුව කිපීම

27. ගිජු ලෙස ආහාර අනුභව කරන්නන් පස්දෙනා අතර නැගිට ගැනීමටවත් බැරි තරමට කෑම ගෙන එහිම පෙරළී සිටින තැනැත්තා
(1) තත්ථාවට්ටක (2) කාකමාසක
(3) අලංසාටක (4) භුත්තවම්තක

28. ආහාර ගැනීමේ දී පමණ දැන සිහිනුවණින් යුතුව ආහාර ගන්නා ලෙස බුදු රජාණන් වහන්සේ අවවාද කළේ
(1) කොසොල් රජතුමාට (2) බිම්බිසාර රජතුමාට
(3) අජාසත් රජතුමාට (4) අනේපිඬු සිටුතුමාට

29. පළමුවන හා තෙවන ධර්ම සංගායනාවන් පවත්වා ඇති ස්ථාන අනුපිළිවෙලින් දක්වා ඇති වරණය වන්නේ
(1) රජගහ නුවර හා විශාලා මහනුවර (2) රජගහ නුවර හා පැළලුප් නුවර
(3) විශාලා මහනුවර හා පැළලුප් නුවර (4) පැළලුප් නුවර හා රජගහ නුවර

30. කණිෂ්ක ධර්ම සංගායනාවේ සභාපතිත්වය පැවරුණු භික්ෂුව වන්නේ
(1) පාර්ශව තෙරුන් (2) යස තෙරුන්
(3) වසු මිත්‍ර තෙරුන් (4) සබ්බකාමී තෙරුන්

31. යම් සේ ගසක මුල ශක්තිමත්ව නොගැලවී පවතින්නේ ඒතාක් කල් එම ගස නැවත නැවත ලියලන්නා සේ පුද්ගලයා ද නැවත නැවත සසර දුකට පත් වන්නේ,
(1) තණ්හාව නිසාය. (2) කර්මය නිසා ය.
(3) ද්වේෂය නිසා ය. (4) මිතුරන් නිසා ය.

32. උස් හඬින් කතා කළහොත් බුදු රජාණන් වහන්සේ තම අසපුවට වැඩම නොකරාවි යැයි කියා තම පිරිවැජියන් නිශ්ශබ්ද කරනු ලැබුවේ කවුරුන් ද?
(1) සංජය පිරිවැජියා (2) පොට්ඨපාද පිරිවැජියා
(3) සෝණදණ්ඩ පිරිවැජියා (4) ද්‍රෝණ බමුණා

33. සූත්‍ර, විනය, අභිධර්ම යන ත්‍රිපිටකයට විභාෂා නම් සර්වාස්තිවාදී අටුවා ග්‍රන්ථ සම්පාදනය කරනු ලැබුවේ,
(1) ප්‍රථම ධර්ම සංගායනාවේදී ය. (2) හතරවන ධර්ම සංගායනාවේදී ය.
(3) කණිෂ්ක ධර්ම සංගායනාවේ දී ය. (4) හයවන ධර්ම සංගායනාවේදී ය.

34. ඇතැම් ස්තූපවල ගර්භයට සම්බන්ධ සිව් දිශාවට මුහුණලා තනන ලද අලංකාර තොරණක් වැනි අංගය හඳුන්වන්නේ
(1) චේතියඝර නමිනි (2) පියගැට පෙළ නමිනි
(3) වාහල්කඩ නමිනි (4) කොරවක්ගල නමිනි

35. පොළොන්නරු යුගයේ පැරණි ම සිතුවම් පැවති ස්ථානයක් නොවන්නේ
(1) සීගිරිය (2) දිඹුලාගල ලෙන්
(3) තිවංක පිළිම ගෙය (4) මහියංගණ ස්තූපයේ ධාතු ගර්භය

36. සතර සංග්‍රහ වස්තුවලට අයත් නොවන කරුණ මින් කුමක් ද?
(1) දානය (2) සීලය (3) ප්‍රියවචන (4) අර්ථචර්යාව

37. දඹදෙණි සාහිත්‍ය යුගයට අයත් ග්‍රන්ථයක් නොවන්නේ,
(1) පූජාවලිය (2) දහම් සරණ (3) කව්සිළුමිණ (4) බුත්සරණ

38. විද්වත් මතය අනුව විශුද්ධි මාර්ගයේ දැක්වෙන ධම්මානුස්සතිය පදනම් කොට ගෙන රචිත ග්‍රන්ථය වන්නේ,
(1) දහම් සරණ (2) සඟ සරණ (3) පූජාවලිය (4) ධර්ම ප්‍රදීපිකාව

39. සංසාරය නමැති සාගරය තරණය කිරීමට මුල්වන ධර්ම කරුණ වන්නේ
(1) කර්මය (2) පන්සිල් (3) දානය (4) ශ්‍රද්ධාව

40. රාජ්‍ය පාලකයාට යුක්තිය, අයුක්තිය, හොඳ නරක තෝරා බේරා ගැනීමට නොහැකි ව මුලා වී අගතිගාමී වීම හඳුන්වන්නේ,
(1) ඡන්දය ලෙස ය. (2) මෝහය ලෙස ය. (3) භය ලෙස ය. (4) ද්වේශය ලෙස ය.

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	10	බුද්ධ ධර්මය	කාලය நேரம் Time: පැය 02

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.

01. i. සිදුහත් කුමරුගේ ළමා අවදියේ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න.

ii භාවනාව සඳහා යොමු වීමේදී පුද්ගලයා තුළ තිබිය යුතු ගුණාංග දෙකක් ලියන්න.

iii බුදු රජාණන් වහන්සේ පළමුවන හා අටවන වස් කාල ගත කළ ස්ථාන පිළිවෙළින් ලියා දක්වන්න.

iv. ධර්ම රත්නයේ ගුණ දැක්වෙන පාඨයේ සඳහන් වන "සන්දිට්ඨිකො" යන්නෙහි අදහස ලියන්න.

v. සිඟාලෝවාද සූත්‍රයේ උතුරු දිශාව හා යට දිශාව ලෙස දක්වා ඇති සමාජ කණ්ඩායම් දෙක පිළිවෙළින් නම් කරන්න.

vi. "ඉමස්මිං අසති ඉදං න හෝති" යන පාඨයේ අර්ථය ලියන්න.

vii මහියංගණ ස්තූපයේ හා අභයගිරි ස්තූපයේ දැක ගත හැකි ස්තූප ආකෘති දෙක නම් කරන්න.

viii ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ සමාධි ශික්ෂාවට ඇතුළත් මාර්ගාංග දෙකක් ලියන්න.

ix ධර්ම ප්‍රදීපිකාව හා කව්සිළුමිණ යන ග්‍රන්ථ රචනා කළ කතුවරු දෙදෙනා පිළිවෙලින් නම් කරන්න.

x බුද්ධ වචනයට අනුව රෝග දෙයාකාරයි. එම දෙයාකාර වූ රෝග නම් කරන්න.

(ලකුණු 2x10=20)

02. i. බුදු දහමේ උගන්වන ප්‍රධාන භාවනා ක්‍රම දෙක නම් කරන්න.

ii. එම භාවනා ක්‍රම දෙකෙන් එක් භාවනා ක්‍රමයක් කෙටියෙන් හඳුන්වන්න.

iii සාර්ථක ශිෂ්‍ය ජීවිතයක් ගත කිරීමට බෞද්ධ භාවනාව උපයෝගී කර ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 2+3+5 =10)

03. i. චතුරාර්ය සත්‍ය අතුරෙන් දෙකක් නම් කරන්න.

ii සසර දුක තුන් ආකාර යැයි ධර්ම විවරණ වල දැක්වේ. එම තුන් ආකාර වූ සසර දුක ලියා දක්වන්න.

iii අප ජීවිතයේ මුහුණ දෙන ගැටලු විසඳා ගැනීමට චතුරාර්ය සත්‍යයෙන් ලබා ගත හැකි ආදර්ශ පැහැදිලි කරන්න. (ලකුණු 2+3+5 =10)

04. i. බුද්ධ කාලීන භාරතයේ පැවති ප්‍රධාන පාලන ක්‍රම දෙක නම් කරන්න.

ii. සප්ත අපරිහානීය ධර්ම අතුරෙන් තුනක් ලියා දක්වන්න.

iii. ධාර්මික රාජ්‍ය පාලනයක් පවත්වා ගැනීමට බෞද්ධ දේශපාලන මූලධර්ම ඉවහල් කර ගත හැකි ආකාරය පෙන්වා දෙන්න.

(ලකුණු 2+3+5 =10)

05. i. බුදු දහම ස්ථාපිත වීමත් සමග මෙරට ගොඩනැගුණු මුල්ම ස්තූපය නම් කර එය කරවන ලද පාලකයා ලියා දක්වන්න.

ii ස්තූපයක රූපසටහනක් ඇඳ එහි කොටස් තුනක් නම් කරන්න.

iii කලා නිර්මාණවලින් පොහොසත් පූජනීය ස්ථාන ආරක්ෂා කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 2+3+5 =10)

06. i සිව්වන ථේරවාදී සංගායනාව (පුස්තකාරූඪ සංගායනාව) පැවැත් වූ ස්ථානය හා අනුග්‍රහය දැක් වූ අය ලියා දක්වන්න.

ii එම ධර්ම සංගායනාව පැවැත්වීමට තුඩු දුන් හේතු තුනක් ලියන්න.

iii ධර්ම විනයෙහි අනාගත සුරක්ෂිතතාවය සඳහා පුස්තකාරූඪ සංගායනාවේ ප්‍රතිඵල ඉවහල් වූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 2+3+5 =10)

07. පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

i. වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ හිමි

ii වටදාගෙය

iii ආසන්න කර්ම

iv ත්‍රිලක්ෂණය

(ලකුණු 5+5 =10)

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank